# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,725/1—1966 දෙසැම්බර් 9 වැනි සිකුරාදා—1966.12.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත්‍ර ආඥපනත

(420 වැනි අධිකාරය වන) ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත්‍ර ආඥපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව මුදල් ඇමති, උක්කු බණ්ඩා වන්නිනායක වන මම, 1966 අංක 22 දරණ විසර්ජන පනතින් ණය මාර්ගයෙන් ගැනීමට බලය පවරන ලද රුපියල් අනූ එක් කෝටියෙන් මෙහි පහත උපලේඛනයෙහි නියමිත මුදල, එම උපලේඛනයේ සඳහන් ක්‍රමය, නියමයන් හා කොන්දේසි අනුව ලංකාව ඇතුළත ණයට ගැනීමට මේ ආඥාවෙන් නියම කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1966 දෙසැම්බර් 7 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. ණයට ගතයුතු මුදල රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක් විය යුතුය. තවද එය සම මිලට නිකුත් කරන අවුරුදු 21/25 ණය මුදලක් වශයෙන් ලබාගත යුතුය.

2. ණය මුදල ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු ඇතිකර, නිකුත් කිරීමෙන් පමණක් ලබාගත යුතුය.

3. ණය මුදල සඳහා ගෙවිය යුතු පොළිය වර්ෂයකට සියයට 4½ක් විය යුතුය.

4. ණය මුදල සඳහා සෑම වර්ෂයකම අර්ධ වාර්ෂික පොළිය ගෙවිය යුතු දිනයන් ජූනි දහසය වැනිද හා දෙසැම්බර් දහසය වැනිද විය යුතුය.

5. ණය බේරීම සඳහා පිහිටුවන නිදන් ධුරමුදලට, වර්ෂයකට සියයට 3 මුදලක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. මේ ගෙවීම 1967 දෙසැම්බර් දහසය වැනිද ආරම්භ විය යුතුය

6. ණය ලබා ගැනීම සඳහා නිකුත් කරන ලද ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු නිදහස් කිරීමේ දිනය, 1991 දෙසැම්බර් දහසය වැනිද විය යුතුය.

එසේ වුවද 1987 දෙසැම්බර් පහළොස් වන දිනට ඉක්බිතිවූත් හය මසකට නොඅඩු කාලයකට පෙර ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනය කින් ඇමතිවරයා විසින් නියම කරනු ලැබිය හැකිවූත් යම් දිනයක, ඒ ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු සම මිළට නිදහස් කිරීමට තෝරා ගැනීමේ බලය රජයට තිබිය යුතුය.

### කාර්ය විස්තර පත

**ව්‍යාපාර වස්තු සඳහා මුදල් භාර ගැනීමේ ලැයිස්තුව 1966 දෙසැම්බර් 16 වැනි දින විවෘත කොට 1967 ජනවාරි 16 වැනි දින වසා දමනු ලැබේ. මුළු ණය මුදල ඊට පළමු ව ලබා ගතහොත්, එම ලබාගත් දිනයෙහි ම මුදල් ලැයිස්තුව වසා දමනු ලැබේ.**

ලබා ගන්නා ණය ප්‍රමාණය රුපියල් 2,50,00,000කි

### ලංකාණ්ඩුවේ සියයට 4½, 1987–91 "ඒ" කාණ්ඩයේ ණය මුදල

**සම මිලට නිකුත් කොට සම මිලටම ආපසු ගෙවනු ලැබේ**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාණ්ඩුව වෙනුවෙන් රුපියල් 2,50,00,000ක ණය මුදලක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. එයට ගෙවනු ලබන පොළී ප්‍රමාණය සියයට 4½කි. ණය මුදල ආපසු ගෙවනු ලබන්නේ 1991 දෙසැම්බර් 16 වැනිද ය. නමුත්, හය මාසයක් කලින් දැනුම දීමෙන් 1987 දෙසැම්බර් 15 වැනිදට පසුව ඕනෑම දිනයක ණය මුදල ආපසු ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ. ණය ආපසු ගෙවන්නේ ද සම මිලටම ය.

**ණය ලබා ගැනීමේ බලය.**—ණය මුදල ලබා ගන්නේ 1966 අංක 22 දරණ විසර්ජන පනතින් ලත් බලයෙන් හා (420 වැනි අධිකාරය වන) ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත් ආඥපනතේ අඩංගු නීති යටතේ ය.

**අරමුණ.**—රජය විසින් මේ ණය මුදල ලබාගනුයේ 1966 අංක 22 දරණ විසර්ජන පනතේ 2 (1) (බී) වගන්තිය යටතේ 1966-67 මුදල් වර්ෂයේ සේවාවන් සඳහා වැය කරණු පිණිසය.

**නිකුත් කරන පිළිවෙළ.**—ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ණය මුදල ලබා ගනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු පිළිබඳව බලපවත්වන කොන්දේසි අඩංගු පත්‍රිකා ලබා ගත හැකිය.)

**ණය කොටසක මිල.**—ණය කොටසක මිල රුපියල් සියයට සියයකි. සම්පූර්ණ මුදල ඉල්ලුම් පත් ඉදිරිපත් කරන විට ගෙවිය යුතුය. අඩුම කොටස රුපියල් සියයකි.

1018/1——ආර්ආර් 19679—11,000 (66/12)

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් 1966 දෙසැම්බර් 16 වැනිද සිට ණය මුදල් ලබා ගන්නා ලැයිස්තුව පියවනතුරු, රාජ්‍ය ණය ලේඛකාධිකාරී විසින් භාර ගනු ලැබේ. ණයට මුදල් දීමේ ඉල්ලීම නියමිත ඉල්ලුම් පත්‍රිකාවල එවිය යුතු අතර, එට ගෙවිය යුතු මුළු මුදල ඒ සමග එවිය යුතුය. ලංකා මුදල් ඉතිරි කිරීමේ බැංකුවේ හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරි කිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කරන්නන්ට ඒ ආයතන සමග කටයුතු පිළියෙළ කොට එවා මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකිය.

බැංකුවලට ද (මුදල් ඉතිරි කිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරි කිරීමේ බැංකුව ඇතුලු) පිළිගත් ව්‍යාපාර වස්තු තැරැව්කාරුවන්ට හා අවසර ලත් තැරැව්කරුවන්ට ද, ඔවුන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත් වෙනුවෙන් භාර ගත් නාමික ණය මුදල අනුව සියයට 1/16ක් කොමිස් වශයෙන් දෙනු ලැබේ, හුවමාරු ගාස්තු වශයෙන් නීතිඥවරුන්ට තමන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත්වල භාරගත් ණය මුදල සම්බන්ධයෙන් ඒ ප්‍රමාණයෙම කොමිස් ගෙවනු ලැබේ,

**ව්‍යාපාර වස්තු සඳහා ගෙවීම.**—" ලංකාණ්ඩුවේ ණය මුදල " යනුවෙන් හරස් රේඛා කොට මහ බැංකුව වෙත ගෙවීමට අණ කරන චෙක් පතකින් මුදල් ගෙවිය යුතුය.

**ව්‍යාපාර වස්තු කොටස් සහතික පත්‍ර.**—ඉල්ලුම් පත් ලැබීමෙන් හා පිළිගැනීමෙන් පසු ව්‍යාපාර වස්තු කොටස් සහතික නිකුත් කරනු ලැබේ.

**පොළිය.**—සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව ජුනි 16 වැනිද හා දෙසැම්බර් 16 වැනිද වසකට සියයට 4½ බැගින් පොළී ගෙවනු ලැබේ. පළමුවෙන් පොළී ගෙවන්නේ 1967 ජුනි 16 වැනිද ය. ඒ පොළිය ගෙවනු ලබන්නේ ඉල්ලුම් පත් පිළිගත් දින සිට 1967 ජුනි 15 වැනිද තෙක් ඒ දිනය ද ඇතුලත් වන කාල සීමාව සඳහා ය.

**අයබදු ගැනීම.**—(i) මුද්දර ගාස්තු :—ණය නිකුත් කිරීම, පවරා දීම හා ආපසු ගෙවීමාදියේ දී පාවිච්චි කරන සෑම ලියවිල්ලක් ම මුද්දර ගාස්තුවලින් නිදහස් ය.

(ii) ආදායම් බදු :—ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට හැර ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන්ට ආදායම් බදු අඩු නොකර පොළී ගෙවනු ලැබේ. නමුත් ආදායම් බද්දට යටත්වන ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන් ආදායම් බදු සඳහා තමාගේ ආදායම පෙන්වීමේ දී එම පොළිය ද අඩංගු කළ යුතුය. ලංකාවේ පදිංචි නොවූවන්ට හා ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට පොළී ගෙවීමට පෙර ආදායම් බදු අඩු කර පොළී ගෙවනු ලැබේ (දනට ආදායම් බදු ප්‍රමාණය, ලංකාවේ පදිංචි නොවූ පුද්ගලයන්ගෙන් සියයට 33⅓ක් ද, ධනය ඒකාබද්ධ වූ හින්දු පවුල්වලින් සියයට 39⅜ක් ද, නිර්නේවාසික සමාගම් වලට ගෙවන ලද හෝ බැර කරන ලද පොළිය සම්බන්ධයෙන් සියයට 67ක් ද වෙයි.) ලංකා ආදායම් බද්දෙන් නිදහස් අයට අය කරනු ලැබූ ආදායම් බදු එම දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ

(iii) ඉතිරිකිරීම් වෙනුවෙන් සහනය :—(1965 අංක 18 දරණ දේශීය ආදායම් බදු (සංශෝධන) පනතේ 31 වැනි වගන්තියෙන් සංශෝධිත) 1963 අංක 4 දරණ දේශීය ආදායම් බදු පනතේ 69 (අ) වගන්තිය යටතේ, ලංකාණ්ඩුවේ සුරැකුම්පත්වල, පුද්ගලයින් විසින් කරනු ලබන ආයෝජන අනුමත කළ ඉතිරිකිරීම් ලෙස සලකන අතර එවා ඉතිරිකිරීම් සහනය සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(iv) ධන බද්ද —ලංකාණ්ඩුවේ සුරැකුම්පත්වල කරන ආයෝජනයන් 1963 අංක 4 දරන දේශීය ආදායම් බදු පනතේ 31 (1) (ජී) වගන්තිය යටතේ පුද්ගලයෙකුගේ ධනයට ඇතුලත් නො කෙරෙන අතර එවා ධන බද්දෙන් ද නිදහස් වේ.

(v) මුදල් බද්ද :—ලංකාණ්ඩුව විසින් ලංකාව ඇතුළත නිකුත්කරන ලද ව්‍යාපාර වස්තු, මුදල් බදු ගෙවීම සඳහා ආණ්ඩුව විසින් භාර ගනු ලැබේ. සම්පූර්ණ මුදල ගෙවූ සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවන ව්‍යාපාර වස්තුවල නාමික මිලත්, එයින් උත්වන පොළියත්, ඒ සමාන මුදල් බද්දක් ගෙවීමට යෙදිය හැක. සම්පූර්ණ මුදල නො ගෙවූ හෝ අඩු මිලට නිකුත් කළ හෝ සම මිලට නොව වෙනයම් මිලකට ආපසු ගෙවන හෝ ව්‍යාපාර වස්තු සඳහා රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකිනුත්, එයින් උපදින පොළියෙනුත් ගෙවිය හැකි මුදල් බදු ප්‍රමාණය වරින් වර ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වේ. නමුත් එවැනි රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකින් ගෙවිය හැකි මුදල් බදු ප්‍රමාණය, මුලින් ව්‍යාපාර වස්තු නිකුත් කරන අවස්ථාවේ දී ගෙවූ මුදලත්, ව්‍යාපාර වස්තුව ආපසු ගෙවීමේ දී ගෙවන මුදලත් යන දෙකින් අඩු මුදල යමක් වේ ද, එයට නො අඩු මුදලක් වේ. මුදලින් මුදල් බදු ගෙවීම වෙනුවට ව්‍යාපාර වස්තු මාර්ගයෙන් ගෙවීම කළ හැක්කේ එම ව්‍යාපාර වස්තු මුලින් නිකුත් කරන අවස්ථාවේ දී ම මියගිය තැනැත්තා විසින් මිලයට ගෙන තිබේ නම් හෝ මරණයට වසකට නො අඩු කාලයකට පෙර එම ව්‍යාපාර වස්තු මිලයට ගෙන තිබේ නම් හෝ පමණකි.

**සුරක්ෂිතතාවය.**—ණය මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ආරක්ෂා වී ඇත. ණය ගෙවීමේ අරමුදල්හි භාරකරුවන් වන මහ බැංකුවේ මුදල් මණ්ඩලය එහි පාලනය යටතේ ණය මුදල් බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලක් පිහිටුවනු ඇත. වර්ෂයකට සියයට 3 ප්‍රමාණය අනුව 1967 දෙසැම්බර් 16 වැනිද සිට නිදන් අරමුදලට අර්ධ වාර්ෂික ගෙවීම් පටන් ගනු ලැබේ

**ආණ්ඩුවේ ණය මුදලේ ප්‍රමාණය.**—දනට ලංකාණ්ඩුවේ දළ සදහන් ණය ප්‍රමාණය රු. 306,21,42,793 කි. ණය බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලේ ආසන්න වෙළඳ වටිනාකම රු. 48,20,07,196 කි. එම නිසා ආණ්ඩුවේ ඉතිරි ශුද්ධ ණය මුදල රු. 258,01,35,597 කි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන්, වාණිජ බැංකුවලින්, කච්චේරිවලින්, තැපැල් කාර්යාලවලින් හෝ ජාතික මුදල් ඉතිරි කිරීමේ ව්‍යාපාරයේ කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ද ලබා ගත හැකි ය.

ඩී. බී. ගුණවර්ධන,
රාජ්‍ය ණය ලේඛකාධිකාරී.

කොළඹ 1,
තැ.පෙ. 1149,
ශ්‍රී ලංකා මහ බැංකුව,
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
1966 දෙසැම්බර් 9 වැනි දින දී ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණ [illegible] මුද්‍රණයයි